**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී ප්‍රථම වසර පරීක්ෂණය (භූගෝල විද්‍යාව)**

**ප්‍රථම සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2019**

# GYG 1106 - භූගෝල විද්‍යාවේ මූලධර්ම

**පැ දෙකයි (02)**

ප්‍රශ්න **හතරකට (04)** පමණක් පිළිතුරු සපයන්න.
ලෝක ආකෘති සිතියම් දෙකක් සපයනු ලැබේ.

---

1.

(i) මානුෂ භූගෝල විද්‍යාවේ උප කොටස් හයක් (06) සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) විෂයක් වශයෙන් භූගෝල විද්‍යාවේ දියුණුව සඳහා දායකත්වය දැක්වූ භූගෝල විද්‍යාඥයින් හතර(04)දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉහත 1 (ii) හි ඔබ නම් කළ භූගෝල විද්‍යාඥයින් දෙදෙනෙකු (02) තෝරා ගෙන මානුෂ භූගෝල විද්‍යාව තුළ මිනිසා සහ පරිසරය අතර සම්බන්ධතාව පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසන්න. (ලකුණු 08)

2.

(i) ''සංස්කෘතික පරිසරය'' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රධාන සංස්කෘතික යුගයන් සහ එක් එක් සංස්කෘතික යුගවල දී භාවිත කළ ප්‍රධාන උපකරණ ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(iii) නූතන යුගය ( modern age) තුළ සංස්කෘතික පරිසරයෙහි සිදු වූ වෙනස්කම් විග්‍රහ කරන්න. (ලකුණු 08)

3.

(i) ප්‍රධාන මානව වර්ගවල ලෝක ව්‍යාප්තිය ලෝක සිතියමක දක්වන්න. (ලකුණු 03)

(ii) විවිධ මානව වර්ගවලට පොදු ශාරීරික ලක්ෂණ සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මානව වර්ගවල ශාරීරික ලක්ෂණ කෙරෙහි බලපාන භූගෝල විද්‍යාත්මක සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 08)

Model Paper

4.

(i) "ස්වාභාවික සම්පත්" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) ස්වාභාවික සම්පත්වල කැපී පෙනෙන ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ස්වාභාවික සම්පත් කළමනාකරණ ක්‍රමවේදයන් සුදුසු උදාහරණ සහිතව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

5.

(i) එක් කටයුත්තක් සඳහා එක් (01) උදාහරණය බැගින් සපයමින් මානව ආර්ථික කටයුතු වර්ග කරන්න. (ලකුණු 03)

(ii) කෘෂිකාර්මික පද්ධති පිළිබඳ ග්‍රිග් (1974) ගේ වර්ගීකරණය සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මධ්‍යධරණී කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ලක්ෂණ කෙරෙහි බලපාන භූගෝල විද්‍යාත්මක සාධක විමසන්න. (ලකුණු 08)

6.

(i) නූතන සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉහත සඳහන් කළ සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප අතුරින් දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 04)

(iii) රටක ආර්ථික සංවර්ධනය සඳහා නූතන සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප කෙතෙක් දුරට භාවිත කළ හැකිදැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

0000000000

Model Paper